# කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම

2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන යටතේ, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා නිර්දේශ කිරීම පිණිස සිය පොදු ජීවිතයේ කීර්තියට පත්-

- නීතිය හෝ ව්‍යවස්ථාකරණය;
- වෘත්තීය සමිති;
- කළමනාකරණය සහ පරිපාලනය;
- ආර්ථික සංවර්ධනය;
- සෞඛ්‍යය;
- අධ්‍යාපනය;
- කාන්තාවන් සවිබල ගැන්වීම හෝ කාන්තාවන්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීමට කැපවූ

යන ක්ෂේත්‍රවලට අදාළව පිළිගත් දැනුම, පළපුරුද්ද සහ විශිෂ්ටත්වය ඇති තැනැත්තන් අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අයදුම්පත්/ නාමයෝජනා කැඳවයි.

තවද, යම් තැනැත්තකු /තැනැත්තියක —

- පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම අවසන් වුවහොත්;
- නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වස්තුභංගත්වයට පත්වූවකුව බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ විනිශ්චය කළහොත්;
- මනසේ හෝ ශරීරයේ අසනීපයක් හෝ වෙනත් අශක්නුතාවයක් හේතුවෙන් ධුරය දිගටම කරගෙන යාමට යෝග්‍ය නොවුවහොත් හෝ යෝග්‍ය නොවන තත්ත්වයකට පත් වුවහොත්;
- නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින්, සිහිවිකල් වූ තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇති හෝ ප්‍රකාශ කරනු ලැබුවහොත්;
- ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිර දඬුවමක් විඳ ඇත්නම් හෝ විඳිමින් සිටී නම්; හෝ
- කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරන ලද කලින් ධූර කාලය තුළ ධූරයෙන් ඉවත් කර ඇත්නම්

ඒ තැනැත්තා/ තැනැත්තිය කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු වේ.

එක් එක් අයදුම්කරු විසින් තම අයදුම්පත 'අ' තොරතුරු ආකෘති පත්‍රයට අනුකූලව සකස් කළ යුතු අතර, නාමයෝජනා 'ආ' තොරතුරු ආකෘතියට අනුකූලව සකස් කළ යුතු වේ. එම ආකෘතිපත්‍ර

පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි www.parliament.lk ක්ෂණික සබැඳි යටතේ '*කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම*' නමින් පළ කර ඇති 'අ' තොරතුරු ආකෘති පත්‍රයට අනුකූලව එක් එක් අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත සකස් කළ යුතු අතර, 'ආ' තොරතුරු ආකෘති පත්‍රයට අනුකූලව නාමයෝජනා සකස් කළ යුතුය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්/ නාමයෝජනා **2025 ජනවාරි 20 වැනි දින හෝ ඊට පෙර**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපෑලෙහි විෂයය වශයෙන් 'කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

නාමයෝජනා එවනු ලබන්නේ නම්, නාමිකයා විසින් ම තොරතුරු පත්‍රය සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර එම තොරතුරු පත්‍රය නාමයෝජනා කරනු ලබන පාර්ශ්වය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත යොමු කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

**2024 දෙසැම්බර් 29**